**“Z”**

<u>කොළඹ දිසා අධිකරණයේදී ය.</u>

කොළඹ 10, ශ්‍රී විපුලසේන මාවතේ, අංක.167/4 දරණ ස්ථානයේ නිහාල් ශ්‍රී අමරසේකර.

<u>පැමිණිලිකරු.</u>

| | | |
|---|---|---|
| නඩු අංකය | : 3155/විශේෂ | එදිරිව |
| ස්වභාවය | : විශේෂ | |
| වටිනාකම | : රු.100,000/- | |
| කාර්ය පටිපාටිය | : සාමාන්‍ය | |

1. ජපානයේ නීති යටතේ සංවිධානය වී තිබෙන හා පවත්නා සමාගමක් වන, ජපානයේ ටෝකියෝ නුවර, චියෝඩා-කු, ඕටමචි 1-චෝම් හි 2-1 දරණ ස්ථානයේ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය තිබෙන සහ කොළඹ 02, වොක්ෂෝල් වීදියේ, අංක.315, දරණ ස්ථානයේ, ශ්‍රී ලංකාවේ සම්බන්ධිකරණ කාර්යාලයයක් සහ/හෝ ව්‍යාපාරික ස්ථානයක් තිබෙන මිට්සුයි ඇන්ඩ් කම්පැනි ලිමිටඩ්.

2. ජපානයේ නීති යටතේ සංවිධානය වී තිබෙන හා පවත්නා සමාගමක් වන, ජපානයේ ටෝකියෝ නුවර, ෂින්ජුකු-කු, නිෂි-ෂින්ජුකු 1-චෝම් හි 25-1 දරණ ස්ථානයේ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය තිබෙන හා මහරගම, හයිලෙවල් පාරේ, අංක.65 දරණ ස්ථානයේ ශ්‍රී ලංකාවේ සම්බන්ධිකරණ කාර්යාලයයක් සහ/හෝ ව්‍යාපාරික ස්ථානයක් තිබෙන තායිසෙ කෝපරේෂන්.

3. ජාපනයේ නීති යටතේ නිසි ලෙස සංවිධානය වී තිබෙන සංස්ථාවක් වන සහ ජපානයේ ටෝකියෝ නුවර, මිනාටෝ-කු, අටාගෝ 1-2-2, මොරි ගොඩනැගිල්ලේ අංක.9 දරණ ස්ථානයේ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය තිබෙන ගෘහ නිර්මාණ ශිල්පීන්

සහ සැලසුම්කරුවන් වන කන්තො කිකාකු සෙක්කිෂා යෝෂෝ ෂිබාටා ඇන්ඩ් ඇසෝෂියේට්ස්.

4. කලින් ලංකා ජැපෑන් හොටෙල්ස් ලිමිටඩ් වශයෙන් හැඳින් වූ සහ කොළඹ 03, ඇල්ප්‍රඩ් පෙදෙසේ, අංක.16 දරණ ස්ථානයේ හොටෙල් ඩෙවලොපර්ස් (ලංකා) ලිමිටඩ්.

5. කොළඹ 03, ඇල්ප්‍රඩ් පෙදෙසේ, අංක.16 දරණ ස්ථානයෙහි හොටෙල් ඩෙවලොපර්ස් (ලංකා) ලිමිටඩ් සමාගමේ සභාපති/කළමණාකාර අධ්‍යක්ෂ කෝර්නල් ලයනල් පෙරේරා.

6. කොළඹ 03, ධර්මපාල මාවතේ, අංක.51/3 දරණ ස්ථානයේ පදිංචි සහ හොටෙල් ඩෙවලොපර්ස් (ලංකා) ලිමිටඩ් සමාගමේ අධ්‍යක්ෂ ප්‍රෙඩ්රික් ජර්මේන් නොයෙල් මෙන්ඩිස්.

7. කොළඹ 07, ශ්‍රීමත් ආර්නස්ට් ද සිල්වා මාවතේ, අංක.23/2 දරණ ස්ථානයේ පදිංචි සහ හොටෙල් ඩෙවලොපර්ස් (ලංකා) ලිමිටඩ් සමාගමේ අධ්‍යක්ෂ කයිර්ෂාස්ප් නරිමාන් චොක්සි.

8. කොළඹ 06, හැව්ලොක් පාරේ, අංක.696/2 දරණ ස්ථානයේ පදිංචි සහ හොටෙල් ඩෙවලොපර්ස් (ලංකා) ලිමිටඩ් සමාගමේ අධ්‍යක්ෂ දොන් පීටර් සෙවරිනස් පෙරේරා.

9. ජපානයේ, කසගාව, චිගසාකි, ෆුජිමිචෝ, 6-38 දරණ ස්ථානයේ සහ හොටෙල් ඩෙවලොපර්ස් (ලංකා) ලිමිටඩ් සමාගමේ අධ්‍යක්ෂ කෂුටාකා කොබෝයි.

10. කොළඹ 06, රාමක්‍රිෂ්ණා මාවතේ, අංක.4 දරණ ස්ථානයේ සහ හොටෙල් ඉඩෙවලොපර්ස් (ලංකා) ිමිටඩ් සමාගමේ අධ්‍යක්ෂ කනපතිපිල්ලේ ශන්මුගලිංගම්.

11. දැනට කොළඹ 02, වොක්ෂෝල් වීදියේ, අංක.315 දරණ ස්ථානයේ සහ හොටෙල් ඩෙවලොපර්ස් (ලංකා) ලිමිටඩ් සමාගමේ අධ්‍යක්ෂ කොපි ඉතෝ.

<u>විත්තිකරුවෝ.</u>

<u>ඉහත නම සඳහන් 4 වැනි විත්තිකරු වෙතය.</u>

(4 වැනි විත්තිකාර සමාගමේ ලේඛණගත නීති උපදේශක, කොළඹ 12, නීතිපති දෙපාර්තමේන්තුවේ, ටී.ජී.ගුණරත්න මහතා මගින් භාරකරවීම පිණිසයි.)

<u>ඉහත නම සඳහන් 4 වැනි විත්තිකරුගෙන් ප්‍රශ්න කිරීම සඳහා පැමිණිලිකරු වෙනුවෙන් වන විචාරණ,</u>

සිවිල් නඩු විධාන සංග්‍රහයේ 94 වගන්තිය ප්‍රකාර, පහත සඳහන් සියළුම විචාරණයන්ට, මෙය භාරදීමේ දී සිට, **<u>දින දහයක් (10)</u>** ක් ඇතුළත ඔබ විසින් පිළිතුරු සැපයිය යුතු බව මෙයින් දැනුම් දෙනු ලබේ.

1. ඉහත නම් සඳහන් 1 වන සහ/හෝ 2 වන විත්තිකරුවන්ගේ නියෝජිත සහ/හෝ නම් කරනු ලැබූ අධ්‍යක්ෂවරයා නොමැතිව ඔබගේ කොටස්කරුවන්ගේ මහ සභා රැස්වීමක් සහ/හෝ ඔබගේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක් සංස්ථාපිත කළ නොහැකි බව ඔබ පිළි ගන්නෙහි ද?

2. එම 1 වැනි සහ/හෝ 2 වැනි විත්තිකරුවන්ගේ නම්කරනු ලැබූ අධ්‍යක්ෂවරයාගේ අනුමැතිය ප්‍රකාශ කෙරෙන ඡන්දය නොමැතිව ඔබගේ අධ්‍යක්ෂ මණ්ඩලයේ දී තීරණ ගැනීමක් සහ/හෝ යෝජනා සම්මත කිරීම් කිසිවක් කළ නොහැකි බව ඔබ පිළි ගන්නෙහි ද?

3. 1 වැනි සහ/හෝ 2 වැනි විත්තිකරුගේ ඉල්ලීම පිට ඔබ සමාගමේ ව්‍යවස්ථාවලියේ 129 වන වගන්තිය යටතේ බලතල යෑදීම මත 1990.03.31 දිනෙන් අවසන් වූ වසරට ඔබගේ වාර්ෂික ගිණුම් ඔබගේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පිළිගනු ලැබූ බව ඔබ පිළි ගන්නෙහි ද?

4. ඉහත කී ගිණුම් සම්බන්ධයෙන් පැමිණිලිකරු විසින් ඔබට විරුද්ධව අංක.3231/විශේෂ දරණ නඩුව පවරන ලද්දේ ද?

5. එම වාර්ෂික ගිණුම් සභාගත කොට පිළිගැනීම ඔබ වළක්වාලමින්, උගත් දිසා විනිසුරුතුමා විසින් එම නඩුවේ ඔබට විරුද්ධව වාරණ නියෝගයක් නිකුත් කරන ලද්දේ ද?

6. මෙම නඩුවට වැදගත් වන්නාවූ සියළු කල්හිම, ඔබ සමාගමේ එදිනෙදා පරිපාලනමය, කළමණාකරණය සහ කටයුතු පූර්ණ ලෙසින් භාරව, 1 වැනි සහ 2 වැනි විත්තිකරුවන්ගේ නියෝජිතයා ඔබ සමාගමේ පූර්ණකාලීන විධායක අධ්‍යක්ෂ වශයෙන් කටයුතු කළ බව ඔබ පිළි ගන්නෙහි ද? එසේ නැත්නම්, ඒ ඇයි?

7. 3 වැනි විත්තිකාර සමාගම විසින් එකී කොළඹ හිල්ටන් හෝටලය සඳහා අඳින ලද සහ ඉදිරිපත් කරන ලද මුල් නිර්මාණ සැළසුම් ඔබගේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක දී සභාගත කර 1984 ජනවාරි මාසයේ දී හෝ ඊට ආසන්නයේ දී පමණ ඔබගේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කළ බව ඔබ පිළි ගන්නේ ද?

8. 3 වැනි විත්තිකාර සමාගම විසින් එකී හිල්ටන් හෝටලය සඳහා අඳින ලද සහ ඉදිරිපත් කරන ලද මුල් නිර්මාණ සැළසුම්වල පිටපතක් 1983 ඔක්තෝබර් මසයේ දී හෝ ඊට ආසන්නයේ දී පමණ නාගරික සංවර්ධන අධිකාරියට ඉදිරිපත් කරන ලද අතර, 1984 මාර්තු මාසයේ දී හෝ ඊට ආසන්නයේ දී පමණ නාගරික සංවර්ධන අධිකාරියෙන් ඒ සඳහා අනුමැතිය ලැබුණේ ද? තව ද 1984 මාර්තු මාසයේ දී ගෙපල කපන උත්සවයකින් එකී කොළඹ හිල්ටන් හෝටලය ඉදි කිරීම පටන් ගත්තේ ද?

9. ඉහත සඳහන් පරිදි ඔබේ විධායක අධ්‍යක්ෂ වශයෙන් කටයුතු කළ එකී 1 වැනි සහ/හෝ 2 වැනි විත්තිකරුවන්ගේ එම නියෝජිතයා, කොළඹ හිල්ටන් හෝටලයේ නිර්මාණ ශිල්පීන් වන එකී 3 වැනි විත්තිකරු කළයුතු කටයුතු නියම කරමින් උපදෙස් දුන් බව ඔබ පිළි ගන්නෙහි ද? එසේ නැතිනම්, ඒ ඇයි?

10. 3 වැනි විත්තිකරු සිය අවසන් සහතික නිකුත් කිරීමට පෙර කොළඹ හිල්ටන් හෝටලය පිළිබඳව ස්වාධීන ඉංජිනේරුවකු ලවා ස්වාධීන පරීක්ෂණයක් සහ හරි වැරදි සොයා බැලීමේ භෞතික පිරික්සුමක් පැවැත්වීම, ඉහත කී ඔබගේ විධායක අධ්‍යක්ෂ වශයෙන් කටයුතු කළ 1 වැනි සහ/හෝ 2 වැනි විත්තිකරුවන්ගේ නියෝජිතයා විසින් විරුද්ධ වී වළක්වාලනු ලැබූ බව ඔබ පිළි ගන්නෙහි ද? එසේ නැත්නම් ඒ ඇයි?

11. ස්වාධීන ඉංජිනේරුවකු ලවා පරීක්ෂණයක් පැවැත්වීම දැක්වූ ඉහත කී විරෝධතාවයට, ඉහත නම සඳහන් 7 වැනි විත්තිකරු ඔහුගේ 1988.08.08 දිනැති ලිපියෙන් සහයෝගය දැක්වූ බව ඔබ පිළි ගන්නෙහි ද?

12. අර්නස්ට් සහ යං සමාගමේ ප්‍රධාන හවුල්කාර වරලත් ගණකාධිකාරී එම්.ටී.එල්.ප්‍රනාන්දු මහතා විසින් රජය විසින් නම් කරනු ලැබූ අධ්‍යක්ෂ වශයෙන්, එවැනි ස්වාධීන පරීක්ෂණයක් ඉල්ලා සිටි බව ඔබ පිළි ගන්නෙහි ද?

13. ඉහත කී ලෙස ඉල්ලා සිටි පරිදි එවැනි කිසිදු හෝ ස්වාධීන පරීක්ෂණයක් කවදා හෝ නොපැවැත්වූ බව ඔබ පිළි ගන්නෙහිද? එසේ නැත්නම්, ඒ මන්ද?

14. ස්වකීය නියෝජිතයින් මගින් 1 වැනි සහ/හෝ 2 වැනි විත්තිකරුවන් පෙනී සිටි ඔබ සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල සහ මුදල් අමාත්‍යාංශයේ පැවති රැස්වීම්වල දී අමුත්තන්ගේ කාමර සහ මහල් සංඛ්‍යාවන් පිළිබඳ වූ අඩුකම් ගැන පැමිණිලිකරු පෙන්වා දුන් බව ඔබ පිළි ගන්නෙහි ද?

15. වෙනත් දේ අතර, කොළඹ හිල්ටන් හෝටලය ඉදිකිරීම සඳහා වූ ඉදිකිරීමේ ගිවිසුමේ මහල් 22 ක් නියම කර තිබුණ බව ඔබ පිළි ගන්නෙහි ද?

16. එකී 3 වැනි විත්තිකරු විසින් ද සහතික කරනු ලැබූ සහ 1 වැනි සහ/හෝ 2 වැනි විත්තිකරුවන් විසින් අත්සන් කර ඉදිරිපත් කරන ලද එම කොළඹ හිල්ටන් හෝටලය ඉදිකිරීමේ ප්‍රගතිය පිළිබඳ මාසික වාර්තාවන් හි, එසේ සහතික කරනු ලැබ ඇති පරිදි, එකී හිල්ටන් හෝටලයේ මහල් සංඛ්‍යාව 20 ක් පමණක් බව ඔවුන් පිළිගෙන ඇති බව ඔබ පිළි ගන්නෙහි ද?

17. සිද්ධිමය කරුණු සහ කඩකිරීම් පිළිබඳව වූ පැමිණිල්ලෙහි ඇති නොයෙකුත් සම්ප්‍රකාශයන් විශේෂයෙන්, 1 වැනි, 2 වැනි සහ/හෝ 3 වැනි විත්තිකරුවන්ගේ කල්ක්‍රියාව සහ ක්‍රියාකලාපය පිළිබඳව ඔබගේ අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීම්වලදී ඔබ කතාබහ කර සාකච්ඡා කළේ ද? නැතිනම්, ඒ ඇයි? එසේ නම්, ඒ මත ගත් ක්‍රියාමාර්ගය කුමක් ද?

18. නොයෙකුත් බලවත් සිද්ධිමය කරුණු සහ කඩකිරීම් පිළිබඳව පැමිණිල්ලේ ඇති සම්ප්‍රකාශයන්, කරණකොටගෙන විශේෂයෙන් 1 වැනි, 2 වැනි සහ 3 වැනි විත්තිකරුවන්ගේ කල්ක්‍රියාව සහය ක්‍රියාකලාපය සම්බන්ධයෙන්, ලැයිස්තුගත පොදු සමාගමක් වශයෙන් ඔබ නිසි පරීක්ෂණ සහ/හෝ විමර්ශණ පැවැත්වීම ඔබ සිදු කළේ ද? එසේ නැතිනම්, ඒ ඇයි? එය එසේනම් ඒ සම්බන්ධයෙන් ඔබ ගත් ක්‍රියා මාර්ගය කුමක් ද?

19. පූර්වෝක්ත සම්බන්ධතාවය අරභයා, අධ්‍යක්ෂ/කොටස්කරුවකු වූ සහ කොළඹ හිල්ටන් හෝටල ව්‍යාපෘතිය පිළිබඳ ප්‍රවර්ධනය සහ සැකසුම් කටයුතුවල නිරත වූ පැමිණිලිකරුගෙන්, ප්‍රධාන පැමිණිලිකරු වශයෙන්, කිසිදු විමසීම් සහ/හෝ කරුණු පැහැදිලි කිරීම් ඉල්ලා සිටීමක් ඔබ කළෙහි ද? එසේ නැතිනම් ඒ මන්ද?

20. එවැනි පරීක්ෂණ සහ/හෝ විමර්ශන ඔබ විසින් සිදුකළේ නම්, ඔබගේ උත්තරය අධිකරණයේ ගොනු කිරීමට පෙරාතුව, ඔබ විසින් එහි අඩංගු කළ නොයෙකුත් කාරණයන් පිළිබඳව, ඔබගේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලදී ඔබ විසින් කතාබහ සහ සාකච්ඡා කරන ලද්දේ ද? එසේ නොකළේ නම් ඒ මන්ද?

21. ලැයිස්තුගත පොදු සමාගමක් විසින් නිසි සහ සාමාන්‍යයෙන් කරනු ලැබීමට ඉඩ තිබෙන පරිදි පැමිණිලි කරනු ලැබ ඇති නොයෙකුත් කඩකිරීම් සහ වැරදි සහගත ක්‍රියාවන් සම්බන්ධයෙන් නීතිය බලාත්මක කිරීමේ අදාළ සහ නිසි බලධාරීන් වෙත ඔබ විසින් යොමු කරන සහ/හෝ වාර්තා කර සිටින ලද්දේ ද? එසේ නැතිනම්, ඒ මන්ද?

22. එසේ කළේ නැතිනම්, එවැනි පරීක්ෂණ සහ/හෝ විමර්ශන නොපවත්වා, මෙම නඩුවට වැදගත් සියළු කල්හිම, ඔබගේ විධායක අධ්‍යක්ෂවරුන් වශයෙන් කටයුතු කළ 1 වැනි සහ/හෝ 2 වැනි විත්තිකරුවන්ගේ සහ/හෝ ඔවුන්ගේ නියෝජිතයන්ගේ නොයෙකුත් වැරදි සහගත කල්ක්‍රියාවන් සහ ක්‍රියා කලාපයන් පිළිබඳව ඔබගේ උත්තරයේ ප්‍රකාශ කර සිටියෙහි ද?

23. ඉහත සඳහන් කාරණයන්ට අමරතව, පැමිණිලිකරු විශේෂයෙන්, ඔහුගේම 91.09.07 සහ 91.11.08 දිනයෙන් දරණ ලිපි මඟින් ඉහත කී 1 වැනි සහ/හෝ 2 වැනි විත්තිකරුවන්ගේ නියෝජිතයන්ගේ වැරදි සහගත කල්ක්‍රියාව සහ ක්‍රියාකලාපය ඔබගේ අවධානයට ලක් කරමින්, ඒ සම්බන්ධයෙන් ක්‍රියා මාර්ගයක් ගන්නා ලෙස ඉල්ලා සිටියේ ද? ලැයිස්තුගත පොදු සමාගමක් වශයෙන් එසේ නොකළේ නම් ඒ මන්ද?

24. පැමිණිල්ලෙහි සම්ප්‍රකාශයන්හි ප්‍රකාශිත ඉහත නම් සඳහන් 5 වැනි සහ 7 වැනි විත්තිකරුවන්ගේ නොයෙකුත් වැරදිසහගත කල්ක්‍රියාවන් සහ ක්‍රියා කලාපයන් පිළිබඳව පරීක්ෂණ සහ/හෝ විමර්ශන නොපවත්වා, එම වැරදි සහගත කල්ක්‍රියාවන් සහ ක්‍රියාකලාපයන් සම්බන්ධයෙන් ඔබගේ උත්තරයෙහි ප්‍රකාශ කර සිටින ලද්දෙහි ද? එසේ නැතිනම්, ඒ මන්ද?

25. පැමිණිලිකරු විසින්, විශේෂයෙන් ඔහුගේ 91.09.07 සහ 91.11.08 දිනයන් දරණ ලිපි මඟින් තවදුරටත් අමතර වශයෙන් ඉහත කී 5 වැනි සහ 7 වැනි විත්තිකරුවන්ගේ වැරදි සහගත කල්ක්‍රියාවන් සහ ක්‍රියාකලාපයන් ඔබගේ අවධානයට යොමු කරවමින්, ඒ පිළිබඳව ක්‍රියා

කරන ලෙස ඉල්ලා සිටින ලද්දෙහි ද? ඒ සම්බන්ධව ක්‍රියා මාර්ගයක් නොගත්තේ නම්, එවිට ලැයිස්තුගත පොදු සමාගමක් වශයෙන් එසේ නොකළේ නම් ඒ ඇයි?

26. එකී 1 වැනි සහ/හෝ 2 වැනි විත්තිකරුවන්ගේ මෙම නඩුවට ඇති සම්බන්ධතාවයන්, ඔබගේ කොටස්කරුවන්ගේ සම්බන්ධතාවයන් හා ප්‍රතිවිරුද්ධව ගැටෙන බව පැමිණිලිකරු විසින් වාචිකව මෙන්ම, ලිඛිතව ද විධිමත්ව සහ නියත වශයෙන් පෙන්වා දෙන ලද්දේ ද?

27. ඉහත තිබෙන පරිදි පැමිණිලිකරු පෙන්නුම් කර දෙනු ලැබුවේ නම්, ඒ පිළිබඳව ඔබ විසින් කිසිදු හෝ ක්‍රියා මාර්ගයක් ගනු ලැබුවේ ද? එසේ නැතිනම්, ඒ මන්ද?

28. මෙම නඩුවට අදාළ කාරණායන් සලකා බැලීමට භාජනය කළ ඔබගේ අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීම්වල ඇතිවූ කතාබහට සහ/හෝ සාකච්ඡාවන්ට එකී 1 වන සහ/හෝ 2 වැනි විත්තිකරුවන් සහභාගී වූවෝ ද?

29. පැමිණිල්ලේ ප්‍රකාශ කර ඇති නොයෙකුත් බලවත් කරුණු පිළිබඳව, විශේෂයෙන් 1 වැනි සහ/හෝ 2 වැනි විත්තිකරුවන්ගේ සහ/හෝ ඔවුන්ගේ නියෝජිතයින්ගේ වැරදිසහගත කල්ක්‍රියාවන් සහ ක්‍රියා කලාපයන් පිළිබඳව, සලකා බලනු ලැබූ, ඔබගේ අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීම්වල කතාබහට සහ/හෝ සාකච්ඡාවන්ට එකී 1 වැනි සහ/හෝ 2 වැනි විත්තිකරුවන්ගේ නියෝජිතයින් සහභාගී වූවෝ ද?

30. ඔබ සහ ඔබගේ කොටස්කරුවන්ගේ සම්බන්ධතාවයට විරුද්ධ සම්බන්ධතාවයක් තිබෙන 1 වැනි සහ/හෝ 2 වැනි විත්තිකරුවන් මෙම නඩුවට පාර්ශවකරුවන් වන පමණින්ම, 1 වැනි සහ/හෝ 2 වැනි විත්තිකරුවන්ගේ නියෝජිතයින් ඉහත කී කතබහට සහ/හෝ සාකච්ඡාවන්ට සහභාගී නොවිය යුතුව තිබුනේ ද? එසේ නැතිනම් ඒ ඇයි?

31. ඉහත කී පරිදි ඔබගේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලදී ඇතිවූ කතාබහට සහ/හෝ සාකච්ඡාවන්ට 1 වැනි සහ/හෝ 2 වැනි විත්තිකරුවන්ගේ සහභාගීවීම ඔබගේ සහ ඔබගේ කොටස්කරුවන් හා සම්බන්ධතාවයන් ස්වාධීනව තක්සේරු කිරීමට අගති ලෙස බලපෑමක් ඇති කළේ ද සහ එය නිෂේධ කළේ ද?

32. ඔබගේ උත්තරය පිළිබඳ කාරණය සලකා බලනු ලැබීමේ දී 1 වැනි සහ/හෝ 2 වැනි විත්තිකරුවන්ගේ නියෝජිතයින් ඔබගේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල ඇති වූ කතාබහට සහ සාකච්ඡාවන්ට සහභාගී වූයේ ද?

33. මෙම නඩුවේ ඔබගේ උත්තරය, අධිකරණයේ ගොනු කිරීමට පෙරාතුවම, එය 1 වැනි සහ/හෝ 2 වැනි විත්තිකරුවන්ට සහ/හෝ ඔවුන්ගේ නියෝජිතයින්ට සහ/හෝ ඒජන්තවරුන්ට දෙන ලද්දේ ද?

34. මෙම නඩුවේ ගොනු කර ඇත්තාවූ ඔබගේ උත්තරය සකස් කිරිමේ දී 1 වැනි සහ/හෝ 2 වැනි විත්තිකරුවන් සහ/හෝ ඔවුන්ගේ නියෝජිතයින් සහ/හෝ ඒජන්තවරුන් විසින් කිසිදු හෝ ආකාරයක අදහස් ප්‍රකාශ කළේ ද සහ/හෝ සාකච්ඡා කලේ ද, සහ/හෝ වෙනත් විධියකින් සහාය වූයේ ද, එසේ නම්, කවුරුන් සමඟ ද, කෙසේ ද?

35. ඔබගේ උත්තරය අධිකරණයේ ගොනු කිරිමට පෙරාතුව සහ/හෝ එසේ කිරිමෙන් අනතුරුව, එම උත්තරයට අදාළ කාරණයන් සම්බන්ධයෙන් ඔබ ඔබගේ කිසියම් හෝ අධ්‍යක්ෂවරුන් සහ/හෝ නිළධාරීන් සහ/හෝ නියෝජිතයින් සහ/හෝ ඒජන්තවරුන් මඟින් එකී 1 වැනි සහ/හෝ 2 වැනි විත්තිකරුවන් සහ/හෝ ඔවුන්ගේ නියෝජිතයින් සහ/හෝ ඒජන්තවරුන් සමග මොනයම් ආකාරයක හෝ සාකච්ඡාවන් කරනු ලැබුවෙහි ද? එසේ නම්, ඒ කවුරුන් මඟින් ද? කෙසේ ද?

36. ලැයිස්තුගත පොදු සමාගමක නිසි සහ වෘත්තිය කල් ක්‍රියාවන්ට අනුකූලව ඔබගේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලදී කරනු ලැබූ නිසි සාකච්ඡා සහ තීරණ ගැනීම් සහ නිසි පරීක්ෂණ සහ/හෝ විමර්ශන කිරිමෙන් පසුව පැමිණිල්ලෙහි ප්‍රකාශ කර ඇති බලවත් කාරණයන් සම්බන්ධයෙන් ඔබ විසින් අධිකරණයට කරුණු ඉදිරිපත් කරන ලද්දේ ද? එසේ නැතිනම්, ඒ මන්ද?

37. පැමිණිලිකරු විසින් ඔහුගේ 1991.07.22 දිනැති ලිපිය මඟින් ඔබගේ රිෆ්ලෙක්ෂන්ස් කැසිනෝ කොන්ත්‍රාත්තුවේ ප්‍රදානයේ අක්‍රමිකතාවන් පිළිබඳව ඔබගේ අවධානය යොමු කරන ලද්දේ ද? එසේ නම් ඒ මත ඔබ ගත් ක්‍රියා මාර්ගය කුමක් ද? එසේ නැතිනම් ඒ මන්ද?

38. පැමිණිලිකරු ඔහුගේ 1991.04.11, 91.07.06, 91.10.10., 92.01.20, 92.01.21 සහ 92.01.28 දිනයන් දරණ ලිපි මඟින් වෙනත් දේ අතර, ඔබගේ උත්තරයට සහ/හෝ ඔබ වෙනුවෙන් අධිකරණයේ සැළකළ කරුණුවලට සම්බන්ධ කාරණයන් ඔබගේ අවධානයට යොමු කර සිටියේ ද? එසේ නම් ඒ මත ඔබ ගත් ක්‍රියා මාර්ගය කුමක් ද? එසේ නැතිනම් ඒ මන්ද?

39. මෙම නඩුවේ නිකුත් කරනු ලැබුවාවූත්, වාරණ නියෝග සහ/හෝ අතුරු තහනම් නියෝග පවතිද්දී, ඉහත නම් සඳහන් 1 වැනි සහ/හෝ 2 වැනි විත්තිකරුවන්ගේ නියෝජිතයින් සහ/හෝ ඔබ සහ ඔබගේ නිළධාරීන්/ඒජන්තවරුන් නියෝජිතයින් සහ/හෝ ශ්‍රී ලංකා රජයේ නිළධාරීන්/නියෝජිතයින් සමඟ සම්මුති සාකච්ඡා පවත්වා ඔවුන්ගේ අභූත ලෙස මුදල් ඉල්ලීම් මත අඩුකිරිම් සහ/හෝ කපාහැරීම් යෝජනා කරන ලද්දේ ද? එසේ නම් ඒ කවුරුන් සමගින් ද?

40. මුල් ණය මුදලේ මුල් මුදලින්/ප්‍රාග්ධනයෙන් 30% ක කපාහැරීමක් 1990 පෙබරවාරි මස හෝ ඊට ආසන්නයේ දී පමණ මුදල් අමාත්‍යාංශය විසින් 1 වැනි සහ 2 වැනි විත්තිකරුවන්ගෙන් ඉල්ලා සිටි බව ඔබ පිළි ගන්නෙහි ද?

41. හෝටල් අමුත්තන්ගේ කාමර 452 ක පදනමක් මත 1 වැනි විත්තිකරු විසින් පිළියෙළ කොට ඉදිරිපත් කරන ලද ප්‍රකාශ පත්‍රය සහ පූර්වානුමාන ලාභදායි ප්‍රකාශය සහ මුදල් ගැලීමේ ප්‍රක්ෂේපණයන් අනුව හෝටල අමුත්තන්ගේ කාමර සංඛ්‍යාවේ අඩුව සම්බන්ධයෙන් එම අවස්ථාවේ දීම මුදල් අමාත්‍යාංශය විසින් ප්‍රශ්න නොනඟන ලද්දේ ද?

42. මෙම නඩුවේ පැමිණිල්ලෙහි සඳහන් රජයේ ඇප සහතික පත් ප්‍රදානය කරන ලද්දේ ඉහත කී පූර්වානුමාන ලාභදායි ප්‍රකාශය සහ මුදල් ගැලීම් ප්‍රක්ෂේපනයන් මත නොවන්නේ ද? එසේ නොමැති නම්, ඒ කුමන පදනමක් මතද?

43. එම සම්බන්ධතාවෙහිලා මුල් ණය මුදලේ මුල් මුදලින්/ප්‍රාග්ධනයෙන් 30% ක කපාහැරීමේ අවශ්‍යතාවය මුදල් අමාත්‍යාංශයේ දී ඔබ අධ්‍යක්ෂ මණ්ඩලය ඉදිරියේ 1 වැනි සහ/හෝ 2 වැනි විත්තිකරුවන්ගේ නියෝජිතයින් සහ/හෝ ඒජන්තවරුන් වෙත දන්වා සිටිනු ලැබූ බව ඔබ පිළි ගන්නෙහි ද?

44. මුල් ණය මුදලේ මුදලින්/ප්‍රාග්ධනයෙන් 30% ක කපාහැරීමේ එකී අවශ්‍යතාවය 1990 මාර්තු මස හෝ ඊට ආසන්නයේ දී මුදල් අමාත්‍යාංශයේදී ඔබගේ සමහර අධ්‍යක්ෂවරුන් සමඟ 1 වැනි සහ/හෝ 2 වැනි විත්තිකරුවන්ගේ නියෝජිතයින් පැමිණි සිටි පසු සාකච්ඡාවකදී වැඩිදුරටත් තහවුරු කරන ලද බව ඔබ පිළි ගන්නෙහි ද?

45. හෝටල් අමුත්තන්ගේ කාමර ගණනෙහි අඩුවීම, එනම්, හෝටලයේ අමුත්තන්ගේ කාමර 452 සිට 387 දක්වා අඩුවීම පිළිබඳ ප්‍රශ්නය 1990 මාර්තු මාසයේ දී හෝ ඊට ආසන්නයේ දී පමණ ඔබගේ සමහර අධ්‍යක්ෂවරුන් ඉදිරියේ දී 1 වැනි සහ/හෝ 2 වැනි විත්තිකරුවන්ගේ නියෝජිතයින්ට තවදුරටත් ස්ථිර කළ බව ඔබ පිළි ගන්නෙහි ද?

46. ඔබගේ අධ්‍යක්ෂවරුන් සමහර දෙනෙකු පැමිණ සිටි 1990 මාර්තු මස හෝ ඊට ආසන්නයේ දී මුදල් අමාත්‍යාංශයේ දී පැවැති සාකච්ඡාවලදී රජයේ ඇප සහතික පත් ප්‍රදානය කරනු ලැබුවේ හෝටලයේ අමුත්තන්ගේ කාමර 452 ක මත ගණන් බැලූ පූර්වානුමාන ලාබදායි ප්‍රකාශය සහ මුදල් ගැලීම් ප්‍රක්ෂේපනයන් මත බව මුදල් අමාත්‍යාංශය විසින් 1 වැනි සහ/හෝ 2 වැනි විත්තිකරුවන්ගේ නියෝජිතයින් වෙත දැනුම් දෙනු ලැබූ බව ඔබ පිළි ගන්නෙහි ද?

47. ඉහත කී මුල් තත්ත්වයෙන් අනියම් මඟක් ගැනීම රජයේ තත්ත්වයට බලපාන බව ඉහත කී සාකච්ඡාවලදී මුදල් අමාත්‍යාංශය විසින් 1 වැනි සහ/හෝ 2 වැනි විත්තිකරුවන්ගේ නියෝජිතයින්ට දන්වනු ලැබූ බව ඔබ පිළි ගන්නෙහි ද?

48. මුදල් අමාත්‍යාංශයේ දී ඉහත කී සාකච්ඡා පැවැති අවස්ථාවේ දී ඔබගේ සභාපති සහ කළමනාකාර අධ්‍යක්ෂ වන ඉහත නම සඳහන් 5 වැනි විත්තිකරු ඔබගේ අධ්‍යක්ෂ මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් 10 වැනි විත්තිකරු කේ.ෂන්මුගලිංගම් මහතා සහ ආර්ථික කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ වී.එම්.වයි.කාසිචේට්ටි මහත්මිය ඉදිරිපිට දී අභිමුඛ අසන ලදුව, 1 වැනි සහ/හෝ 2 වැනි සහ/හෝ 3 වැනි විත්තිකරුවන් වංක සහයෝගයෙන් ක්‍රියා කරමින් ඉදිරිපත් කරනු ලැබූ සංශෝධිත සැළසුම් වශයෙන් විස්තර කළ අළුත් නිර්මාණ සැළසුම් කට්ටලයේ අමුත්තන්ගේ කාමර මහල් දෙකක් අඩුකර ඇති බව පිළිගත් බවත්, ආවරණය කළ රථ ගාල් කිරිමේ කුටි සංඛ්‍යාවේ අඩුවකට තුඩු දුන් පතුල් මහල පිළිබඳව වූ සමථය පෙන්නුම් කර දෙන ලද්දේ ද එම 5 වැනි විත්තිකරු විසින්ම බවත්, ඔබ දන්නෙහි ද?

49. (පැ.8) වශයෙන් සලකුණු කොට මෙම නඩුවට ගොනු කර ඇත්තාවූ 1980 ජූලි මස දිනැති 3 වැනි විත්තිකරුගේ නිර්මාණික සැලසුම්වල සම්මත ප්‍රමාණයේ අමුත්තන්ගේ කාමර කුටි/සම්මත කාමර මාපක 456 ක් කුළුණු දෙකක තිබෙන බව ඔබ පිළි ගන්නෙහි ද? එසේ නැතිනම් ඒ මන්ද?

50. තරු පහේ පන්තියේ ජාත්‍යන්තර හෝටල් සඳහා වූ ප්‍රමිතීන්ට අනුකූලව ඔබගේ ඉහත කී (පැ.8) නිර්මාණ සැලසුම්වල තිබෙන අමුත්තන්ගේ කාමර කුටි/කාමර කාමර මාපකවල සම්මත ප්‍රමාණය හතරැස් මීටර 33 ක් වුණ බව ඔබ පිළි ගන්නෙහි ද? එසේ නැතිනම් ඒ මන්ද?

51. එවැනි සම්මත ප්‍රමාණයේ අමුත්තන්ගේ කාමර කුටි/කාමර මාපක සාමාන්‍යයෙන් සම්මත ද්විත්ව පදිංචි හෝටල අමුත්තන්ගේ කාමර වශයෙන් විකුණනු ලබන බව සහ විධායක කාමර සංයුක්ත කිරිමට එවැනි සම්මත ප්‍රමාණයේ අමුත්තන්ගේ කාමර කුටි/කාමර ඒකක දෙකක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් ඒකාබද්ධ කරනු ලබන බව ඔබ පිළි ගන්නෙහි ද? එසේ නැතිනම් ඒ මන් ද?

52. ඉහත කී (පැ.8) නිර්මාණ සැලසුම්වල එක කුළුණක සෑම විසිත්ත කාමර තට්ටුවකම එවැනි සම්මත ප්‍රමාණයේ අමුත්තන්ගේ කාමර කුටි/කාමර මාපක 12 බැගින් ඇති බවත්, කුළුණු දෙකෙහිම මුළු සංඛ්‍යාව ගත් කල්හි, එවැනි සම්මත ප්‍රමාණයේ අමුත්තන්ගේ කාමර කුටි/මාපක 24 ක් තිබෙන බව ඔබ පිළි ගන්නෙහි ද? එසේ නැතිනම් ඒ මන්ද?

53. මේ අනුව, ඉහත සඳහන් නිර්මාණ සැලසුම්වල (පැ.8) ඉහත සඳහන් සම්මත ප්‍රමාණයේ අමුත්තන්ගේ කාමර කුටි/මාපක 456 මුළු සංඛ්‍යාවම, එක් කුළුනක අමුත්තන්ගේ කාමර තට්ටු 19 ක අඩංගු වුන බව ඔබ පිළි ගන්නේ ද? එසේ නැතිනම් ඒ මන්ද?

54. මේ අනුව එක් කුළුනක අමුත්තන්ගේ කාමර තට්ටුවක සම්මත ප්‍රමාණයේ අමුත්තන්ගේ කාමර කුටි/මාපක 12 x අමුත්තන්ගේ කාමර තට්ටු 19 x ඉහත සඳහන් පරිදි කුළුණු 02 = ඉහත කී නිර්මාණ සැලසුම් (පැ.8) හි කුළුණු 02 හි අඩංගු සම්මත ප්‍රමාණයේ අමුත්තන්ගේ කාමර කුටි/ඒකක 456 බව ඔබ පිළි ගන්නෙහි ද? එසේ නැතිනම් ඒ මන්ද?

55. ඔබ විසින් 1985 ජුලි මස දී ''සංශෝධිත සැලසුම්'' වශයෙන් විස්තර කරමින් ඉදිරිපත් කරනු ලැබූ අළුත් නිර්මාණ සැලසුම් කට්ටලෙහි ඇත්තේ එක් කුළුණක අමුත්තන්ගේ කාමර තට්ටු 17 ක් පමණක් බව ඔබ පිළි ගන්නෙහි ද? එසේ නැති නම් ඒ මන්ද?

56. එමනිසා එවැනි අමුත්තන්ගේ කාමර තට්ටු අඩු සංඛ්‍යාවක් වූ 17 ක ඉහත සඳහන් පරිදි අමුත්තන්ගේ කාමර කුටි/මාපක 456 ක් තිබිය නොහැකි බව ඔබ පිළි ගන්නෙහි ද? එසේ නැතිනම් ඒ මන්ද?

57. හිල්ටන් ඉන්ටර්නැෂනල් ආයතනය, 1 වැනි විත්තිකරුට ද පිටපතක් සහිතව යැවූ 1983.03.31 දින දරණ ලිපියෙන්, ඉහත සඳහන් නිර්මාණික සැලසුම් (පැ.8) පදනම් කොටගෙන පිළියෙළ කරනු ලැබූ ඔවුන්ගේ ලාභදායක පූර්වානුමාන ප්‍රකාශ ස්ථිර කර සිටි බව ඔබ පිළි ගන්නෙහි ද? එසේ නැතිනම් ඒ කුමන පදනමක් මත ද?

58. එකී 1 වැනි සහ 2 වැනි විත්තිකරුවන්ට ඉදිකිරීම ප්‍රදානය කිරීමේ ලිපිය නිකුත් කරනු ලැබුවේ එදිනටම පෙර දිනයේ ම - එනම් 1983.03.03 දින බව ඔබ පිළි ගන්නේ ද? එසේ නැත්නම් කවදා ද?

59. ඉන් අනතුරුව, 1 වැනි විත්තිකරු විසින් නිතර නිතර ඉදිරිපත් කරන ලද ලාභදායක පූර්වානුමාන ප්‍රකාශ සහ මුදල් ගැලීම් ප්‍රක්ෂේපණයන්, ඉහත කි නිර්මාණ සැලසුම්වල (පැ.8) පදනම මත වූ, හිල්ටන් ඉන්ටර්නැෂනල් ආයතනයේ ඉහත සඳහන් ලාභදායක පූර්වානුමාන ප්‍රකාශයන්ට තරයේම අනුකූලතාවයකින් යුතු වුණ බව ඔබ පිළි ගන්නෙහි ද?

60. ඉහත නම් සඳහන් 3 වැනි විත්තිකරුගෙන් සමහර ඒකාන්ත කරුණු පැහැදිලි කිරීම් ලැබෙන තෙක් ඉහත කි 1 වැනි සහ/හෝ 2 වැනි විත්තිකරුවන් වෙත කිසිදු මුදලක් ගෙවීම සම්බන්ධයෙන් 1989 නොවැම්බර් සහ 1989 දෙසැම්බර් මාසයන් හි පැවති අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීම්වලදී පැමිණිලිකරු විසින් විරෝධතා පළකර නොසිටියේ ද? පැමිණිලිකරු විසින් ගනු ලැබූ එම තත්ත්වයට ඉහත කී එම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල දී විරෝධතාවක් පළ වූයේ නැද්ද? නො එසේ නම් පැමිණිලිකරු කුමක් කීවේ ද?

61. පැමිණිලිකරුගේ එම තත්ත්වය ම ඉහත කී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල දී විරුද්ධ නොවූයේ ද? නොඑසේ නම්, විරුද්ධ වූයේ කව් ද?

62. මහජන කොටස්කරුවන්ට ඔවුන්ගේ කොටස් මූලධන මුදල ආපසු දෙන ලෙස ඒ අවස්ථාවේදීම පැමිණිලිකරු යෝජනා නොකළේ ද? නොඑසේ නම් පැමිණිලිකරු කුමක් කීවේ ද?

63. ඔවුන් වෙත එක්සත් ජනපද ඩොලර් මිලියන 2.0 ක ගෙවීමක් මුදාහැර ගනු පිණිස 1990 ජනවාරි මස හෝ ඊට ආසන්නයේ දී ඉහත කී 1 වැනි සහ/හෝ 2 වැනි විත්තිකරුවන්ගේ නියෝජිතයින් ඉහත නම් සඳහන් 5 වැනි සහ 7 වැනි විත්තිකරුවන් සමගින් මුදල් අමාත්‍යාංශයේ නිළධාරින් හමු නොවූයේ ද? නො එසේ නම් එම රැස්වීම පැවැත්වූයේ ඇයි?

64. එම හමුවීම සිදු කෙරුණේ ඉහත සඳහන් පරිදි ඊට පෙර ආසන්නයේදීම 1989 නොවැම්බර් සහ 1989 දෙසැම්බර් මාසයන්හිදී පැවැති ඔබගේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලදී පැමිණිලිකරු විසින් ප්‍රකාශ කරන ලද අදහස් මග හැරීමට සහ නොසලකා හරිමින් නොවේ ද? නො එසේ නම් එම රැස්වීම පැවැත්වූයේ ඇයි?

65. ඉහත සඳහන් එක්සත් ජනපද ඩොලර් 2.0 මිලියනයක ගෙවීමක් මුදාහැර ගනු ලැබීම සඳහා මුදල් අමාත්‍යාංශයේ එකඟත්වය ලබාගන්නා ලද්දේ ඔබේ අධ්‍යක්ෂ මණ්ඩලයේ දී ඉහත කී තත්ත්වය පිළිබඳව පූර්ණ එළිදරව්වක් නොකිරීමෙන් නොවේ ද? නොඑසේ නම් කුමක් එළිදරව් කළේ ද?

66. ඔවුන්ට කිසිම ගෙවීමක් නොකරන ලෙසට පැමිණිලිකරු විරෝධතා ප්‍රකාශ කර තිබියදී, සහ 3 වැනි විත්තිකාර ගෘහ නිර්මාණ ශිල්පීන්ගේ සමහර නියත පැහැදිලි කිරීම් ඉල්ලා තිබියදී පසුව 1990.02.21 දින හෝ ඊට ආසන්නයේ දී 1 වැනි සහ/හෝ 2 වැනි විත්තිකරුවන්ගේ නියෝජිතයා 7 වැනි විත්තිකරුට ලිපියක් නොලීවේ ද? නො එසේ නම් ඔහු කුමක් ලිව්වේ ද?

67. එහි ප්‍රතිඵලයක් වශයෙන්, එවැනි කරුණු පැහැදිලි කිරීම් නිර්මාණ ශිල්පීන් වන එකී 3 වැනි විත්තිකරුගෙන් ඉල්ලා සිටීම අනවශ්‍ය බව සහ ඔවුන්ට ගෙවීම් කළ හැකි බව ඉහත නම් සඳහන් 7 වැනි විත්තිකරු ලියා දන්වා නොසිටියේ ද?

68. ඉහත සඳහන් එක්සත් ජනපද ඩොලර් 2.0 මිලියනයක ගෙවීම ඉහත කී 1 වැනි සහ/හෝ 2 වැනි විත්තිකරුවන්ට ගෙවීම කළේ ද?

69. පැමිණිලිකරු විසින් ඉහත සඳහන් සැලකිය යුතු විමසීම්/විෂමතාවන් මතු කරමින් 3 වැනි විත්තිකරුගෙන් නියත කරුණු පැහැදිලි කිරීමක් ඉල්ලා සිටීමෙන් පසුව, 75% ක පාලනමය අයිතියක් සැලසීම සඳහා ඔවුන්ගේ කොටස්වලින් කොටසක් භාණ්ඩාගාරයේ ලේකම් වෙත පැවරීමට 1 වැනි සහ/හෝ 2 වැනි විත්තිකරුවන් යෝජනා කර සිටි බව ඔබ දන්නෙහි ද? නො එසේ නම් ඔවුන් කුමක් යෝජනා කළේ ද?

70. ඉහත කී යෝජනාව ලිඛිතව කරන ලද්දක් බව ඔබ දන්නෙහි ද? එසේ නම් එම ලේඛණයේ දිනය කුමක් ද?

71. එම යෝජනාව කරන ලද්දේ එම 1 වැනි සහ/හෝ 2 වැනි විත්තිකරුවන් පාර්ශවකරුවන් නොවී භාණ්ඩාගාරයේ ලේකම් විසින් ඔබ සමාගමේ සමාගම් ව්‍යවස්ථාව සංශෝධනය කිරීමට හැකිවන සේ ද? එසේ නම් ඇයි?

72. ඉහත කී 1 වැනි සහ/හෝ 2 වැනි විත්තිකරුවන් වෙනත් කරුනු අතර, ඉහත කී යෝජනාවන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රජයේ නිළධාරීන්/නියෝජිතයින් සමඟ කිසිදු හෝ කතාබහ සහ/හෝ සම්මුති සාකච්ඡා කරනු ලැබූ බව ඔබ දන්නෙහි ද? එසේ නම්, ඒ කවුරුන් සමඟින් ද?

73. ඉහත කී 1 වැනි සහ/හෝ 2 වැනි විත්තිකරුවන්ගේ නියෝජිතයින් වෙනත් කරුණු අතර, ඉහත කී යෝජනාවන් සම්බන්ධයෙන් නිතිපති දෙපාර්තමේන්තුවේ නිළධාරීන්/නියෝජිතයින් සමඟ කිසිදු හෝ කතාබහ සහ/හෝ සම්මුති සාකච්ඡා කරනු ලැබූ බව ඔබ දන්නෙහි ද? එසේ නම්, ඒ කවුරුන් සමඟින් ද?

74. මෙම නඩුවට අදාළ වූ කිසිදු හෝ කාරණාවන් සම්බන්ධයෙන් 1 වැනි සහ/හෝ 2 වැනි විත්තිකරුවන්ගේ නියෝජිතයින් විසින් නීතිපති දෙපාර්තමේන්තුවේ නිළධාරීන්/නියෝජිතයින් සමඟ කිසියම් කතාබහ සහ/හෝ සම්මුති සාකච්ඡා පවත්වනු ලැබුවේ දැයි ඔබ දන්නෙහි ද? එසේ නම් ඒ කවුරුන් සමඟ ද?

75. අයෝජන ගිවිසුමේ (පැ.9) ගෙනහැර දක්වා ඇති ප්‍රකාර කොළඹ හිල්ටන් හෝටලය පිහිටි ඉඩම නාගරික සංවර්ධන අධිකාරියට වාරික මගින් බදු කුලී ගෙවීමේ පදනම මත එකී ආයෝජන ගිවිසුමේ පාර්ශවයක් වන සීමාසහිත කෝර්නල් සහ සමාගම විසින් නාගරික සංවර්ධන අධිකාරිය වෙතින් ප්‍රධාන බද්දක් යටතේ බදුගෙන, එකී සීමාසහිත කෝර්නල් සහ සමාගම වෙතින් එම ඉඩමක අතුරු බද්දකට ගන්නා ලද එකක් නොවේ ද?

76. එම මුල් බදු ගිවිසුමේ නියමයන් යටතේ නාගරික සංවර්ධන අධිකාරිය වෙත එම බද්ද සඳහා කළයුතුව තිබූ ගෙවීම් එකී සීමාසහිත කෝර්නල් සහ සමාගම විසින් යුහුසුළුව සහ නිසියාකාරව ගෙවන ලද්දේ ද?

77. මුල් බද්ද යටතේ ඉහත කී වාරික ගෙවීම් නොකිරීම අතුරු බද්ද යටතේ වන ඔබගේ අයිතිවාසිකම, හිමිකම් සම්බන්ධතාවයන්, බුක්තිය අඛණ්ඩව පැවැතීමට බලපෑමක් නොවන්නේ ද?

78. 99 වසරක කාලසීමාව සඳහා වූ අතුරු බද්ද සඳහා පූර්ණ ප්‍රතිෂ්ඨාව ඔබ සමාගමේ වැඩි කොටස් දැරීමක් සීමාසහිත කෝර්නල් සහ සමාගම වෙත වෙන්කර දීමෙන්, ඔබ විසින් ගෙවනු ලැබුවා නොවේ ද?

79. ඉහත කී 1 වැනි සහ 2 වැනි විත්තිකරුවන් වෙත නිකුත් කරනු ලැබූවාවූ ඉහත සඳහන් රජයේ ඇප සහතික පත් සම්බන්ධ කොටගෙන ඇතුළත් වනු ලැබූවාවූ ලිඛිත ගිවිසුමක් ප්‍රකාර සීමාසහිත කෝර්නල් සහ සමාගම විසින් ඉහත කී කොටස් දැනට ශ්‍රී ලංකා රජය විසින් දරනු ලබන අයුරින් ශ්‍රී ලංකා රජය වෙත නොපවරන ලද්දේ ද?

80. ප්‍රධාන බද්ද යටතේ වාරික මුදල් ගෙවීම පැහැරහැරීම හේතුකොටගෙන, නාගරික සංවර්ධන අධිකාරිය නීතිපති දෙපාර්තමේන්තුව මඟින් පෙනී සිටිමින්, සීමාසහිත එකී කෝර්නල් සහ සමාගමට විරුද්ධව නඩු පවරා ඇති බව ඔබ දන්නෙහි ද?

81. එකී ප්‍රධාන බද්ද යටතේ, එකී සීමාසහිත කෝර්නල් සහ සමාගම නාගරික සංවර්ධන අධිකාරියට එම වාරික මුදල් ගෙවීම පැහැරහැරීම හේතුකොටගෙන, නාගරික සංවර්ධන අධිකාරිය සමඟ වූ එම ප්‍රධාන බද්ද අවලංගු කර සහ/හෝ ශ්‍රී ලංකා රජය මඟින් පවරා ගනු ලැබූවේ ද සහ/හෝ මුදල් අමාත්‍යාංශය මඟින් පවරා ගනු ලැබූවේ ද?

82. එසේ නම්, ඉහත කී බද්ද අවලංගු කිරීමේ ප්‍රතිඵලය වියයුතුව තිබුණේ සීමාසහිත කෝර්නල් සහ සමාගම සමඟ වූ ඉහත කී ලිඛිත ගිවිසුම අවලංගු කිරීම නොවේ ද? එසේ නැත්නම් ඒ මන්ද?

83. එසේ නම් ඔබ නාගරික සංවර්ධන අධිකාරියේ ප්‍රධාන බදු ගැනුම්කරු බවට පත් වියයුතු නොවේ ද? නො එසේ නම් ඒ මන්ද?

84. ණය මුදල් කෙරෙහි නිකුත් කරනු ලැබුවා වූ මූලික රජයේ ඇප සහතික පත්වල ඒ අවස්ථාවේ දී වටිනාකම එක්සත් ජනපද ඩොලර් 55.0 මිලියනයකට පමණ රාශිකෘත නොවූයේ ද?

85. 1990 සැප්තැම්බර් මස දී 1 වැනි සහ/හෝ 2 වැනි විත්තිකරුවන් විසින් ඉල්ලනු ලබන මුදල්වල වටිනාකම එක්සත් ජනපද ඩොලර් මිලියන 55.0 ක් පමණ නොවූයේ ද?

86. ඉහත කී රජයේ කොටස්වලින් දැරීමෙන් කොටසක් සීමාසහිත කෝර්නල් සහ සමාගමට ආපසු දීමට එකඟත්වයකට එළඹියේ ද?

87. එසේ නම්, එම ඇප සහතිකවල අගය එසේ වැඩිවී තිබියදී ඉහත කී රජයේ කොටස්වලින් කොටසක් සීමාසහිත කෝර්නල් සහ සමාගම වෙත ආපසු පැවරීමට එකඟත්වයකට එළඹියේ කුමන පදනමක් මත ද?

88. ලැයිස්තුගත පොදු සමාගමක් වශයෙන් ඔබගේ කොටස් පැවරීම් කළයුතුව ඇත්තේ කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරු මධ්‍යස්ථානයේ වෙළඳ සංචිතය මගින් පමණක් නොවන්නේ ද?

89. (පැ.9) ආයෝජන ගිවිසුමෙහි 3.03 වගන්තියේ විධිවිධාන සලසා ඇති පරිදි පොදු කොටස් නිකුතුවේ දී නොවිකුණ කොටස් සීමාසහිත කෝර්නල් සහ සමාගම විසින් මිළට ගැනිමට බැඳුනේ ද?

90. පොදු ජන කොටස් නිකුතුවෙන් නොවිකුණු ඉතිරි කොටස් ගණන කොපමණ ද?

91. ඒ අනුව, මහජන කොටස් නිකුතුවේ දී සිදුවූ අඩුව සපුරා ගෙවන ලෙස සීමාසහිත කෝර්නල් සහ සමාගම වෙතින් ඉල්ලා සිටින ලද්දේ ද? එසේ නැතිනම් ඒ මක්නිසා ද?

92. 1990 ජනවාරි මස මුදල් අමාත්‍යාංශයේ දී 5 වැනි සහ 7 වැනි වින්තිකරුවන් 1 සහ 2 වැනි වින්තිකරුවන් ද සමගින් ඇති වූ සාකච්ඡාවේ විපාක වශයෙන් 1 වැනි සහ/හෝ 2 වැනි වින්තිකරුවන් වෙත ඉහත කී එක්සත් ජනපද ඩොලර් 2.0 මිලියනයක ගෙවීම කිරීමට හැකිවන සේ අඩුකමේ කොටසක් පියවා ගැනිම සඳහා රුපියල් 40.0 මිලියනයක ආයෝජනයක් කිරීමට ශ්‍රී ලංකා රජය/මහා භාණ්ඩාගාරයේ ලේකම්ට සැලසුවේ ද?

93. වෙනත් දේ අතර පිළිවෙලින් 5 වැනි හා 6 වැනි වින්තිකරුවන් වන කෝර්නල් එල්.පෙරේරා, එෆ්.ජී.එන්.මැන්ඩිස් සහ පැමිණිලිකරු ද, සමාගමේ අධ්‍යක්ෂවරුන් වශයෙන් ඉවත් කිරීමට 1980 අගෝස්තු මස හෝ ඊට ආසන්නයේ දී ප්‍රධාන කොටස්කරු වශයෙන් මහා භාණ්ඩාගාරයේ ලේකම් විසින් යෝජනා සම්මතයන් පිළිබඳ දැන්වීමක් කරන ලද්දේ ද?

94. ඉන් අනතුරුව 1990 ඔක්තෝබර් මස හෝ ඊට ආසන්නයේ දී මහා භාණ්ඩාගාරයේ ලේකම් විසින් එම යෝජනාව ඉල්ලා අස්කර ගනු ලැබීද? එසේ නම් ඒ මන්ද?

95. සීමාසහිත කෝර්නල් සහ සමාගමට අදාළ වූ ඉහත කී කාරණයන් සම්බන්ධයෙන් 5 වැනි විත්තිකරු වූ කෝර්නල් එල්.පෙරේරා/සීමාසහිත කෝර්නල් සහ සමාගමේ නියෝජිතයින්, නීතිපති දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කරන ලද්දේ ද? එසේ නම් ඒ කවුරුන් සමඟින් ද?

96. එවැනි ඉහත කී සාකච්ඡාවල ප්‍රතිඵලයක් වශයෙන් ඔබේ අධ්‍යක්ෂ මණ්ඩලයෙන් පැමිණිලිකරු ඉවත් කිරීමට තුඩු දෙමින් 1990 දෙසැම්බර් මාසයේ දී ඔබ සමාගමේ ව්‍යවස්ථාව වෙනස් කළේ ද? එසේ නම් ඇයි?

97. ශ්‍රී ලංකාවේ හිල්ටන් හෝටල ව්‍යාපෘතියේ ප්‍රවර්ධනය සහ වැඩ ඉටුකිරීම වෙනුවෙන් එකී 1 වැනි විත්තිකරුට දෙනු ලබන ප්‍රවර්ධන සේවාවන් සහ සහාය සම්බන්ධයෙන්, මෙම නඩුවේ ගොනු කර ඇති (පැ.6) මූලික ගිවිසුමේ 3 සහ 4 වගන්තිවල නියම කර ඇති ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව සහ සැපයුම් කොන්ත්‍රාත්තුව සඳහා වූ මුළු කොන්ත්‍රාත්තු මිළ ගණන මත ජපාන යෙන්වලින් 2.5% ක වන්දියක් වෙනුවෙන්, නියම කරනු ලැබූ නොයෙකුත් කොන්දේසි නියමයන් මත ඉහත නම් සඳහන් 1 වැනි විත්තිකරු, සිය සමාගම වෙනුවෙන් එහි විදේශ සංවර්ධන සහ ඉදිකිරීම් අංශයේ සාමාන්‍යාධිකාරී එම්.යෝෂියුචි විසින් අත්සන් කරනු ලැබූ මූලික ගිවිසුම නමැති ගිවිසුමට එක්සත් ජනපදයේ ලියාපදිංචි සමාගමක් සමග 1983 අප්‍රේල් මස 08 වන දින ඇතුළත් වූ බව ඔබ දන්නෙහි ද?

98. ඉහත කී ගිවිසුම අභිභවනය කරමින්, 1 වැනි විත්තිකාර සමාගම, සිය සමාගම වෙනුවෙන් විදේශ සංවර්ධන ඉදිකිරීම් අංශයේ සාමාන්‍යාධිකාරී එම්.යෝෂියුචි විසින් අත්සන් කරනු ලැබ, ජපානයේ යෙන් මිලියන 340,000,000 (ජපාන යෙන් මිලියන 340 ක) නියමිත වන්දියක් සඳහා, නියම කරනු ලැබූ කොන්දේසි නියමයන් යටතේ ශ්‍රී ලංකාවේ කොළඹ හිල්ටන් හෝටල ව්‍යාපෘතිය ප්‍රවර්ධනය කිරීම සහ වැඩ ඉටු කිරීම වෙනුවෙන් 1 වැනි විත්තිකරුට දෙනු ලබන ප්‍රවර්ධන සේවා සහ වැඩ ඉටු කිරීම සම්බන්ධයෙන් 1984 අප්‍රේල් මස 01 වැනි දින, එක්සත් ජනපදයේ ලියාපදිංචි සමාගමක් සමඟ වැඩිදුර ගිවිසුමකට ඇතුළත් වූ බව ඔබ දන්නෙහි ද?

99. ඉහත කී ගිවිසුමේ තිබෙන ඉහත කී කොන්දේසි නියමයන් වෙනත් දෑ අතර, පහත සඳහන් සේවාවන් 1 වැනි විත්තිකාර සමාගම විසින් ලබාගැනීම, සහ එම සමාගමට ලැබීම ද ඇතුළත් වූ බව ඔබ දන්නෙහි ද?

> ''(අ) (මෙහි මින්මතු ''ණය ගිවිසුම'' යයි කියනු ලබන) 1984 ජනවාරි මස 31 වැනි දිනට වන සේ ණයට දෙන්නන් වශයෙන් මිට්සුයි සහ තයිසෙයි සහ ණයට ගන්නන් වශයෙන් හොටෙල් ඩෙවලොපර්ස් (ලංකා) ලිමිටඩ් විසින් සහ අතර ඇතුළත් වන්නට යෙදුණු ණය ගිවිසුම සඳහා 'ඩී' ලකුණු කළ අනුබද්ධයක් වශයෙන් යාකොට ඇති ශ්‍රී ලංකා රජයෙන් ඇප සහතික ලිපිය ලැබීම,

(ආ) ණය ගිවිසුමෙහි 6 වැනි වගන්තියේ දැක්වෙන ප්‍රකාශ මිට්සුයි සමාගම සෑහීමට පත්වන ආකාරයේ ශ්‍රී ලංකාවේ නීතිපතිගේ ලැබීම,

(ඇ) (මෙහි මින්මතු 'අයෝජන ගිවිසුම' යයි කියනු ලබන) මිට්සුයි, තයිසෙයි සීමාසහිත කෝර්නල් සහ සමාගම සහ ශ්‍රී ලංකා රජය විසින් සහ අතර 1984 ජනවාරි මස 31 වැනි දිනට වන සේ ඇතුළත් වන්නට යෙදුණු හොටෙල් ඩෙවලොපර්ස් (ලංකා) ලිමිටඩ් සමාගමෙහි අයෝජනය කිරීම සඳහා වූ ගිවිසුමෙහි දැක්වෙන ප්‍රකාර සමාගම මෙහෙයුම් පටන් ගත් පසු වසර 10 ක් සඳහා වූ කාලසීමාව සඳහා හොටෙල් ඩෙවලොපර්ස් (ලංකා) ලිමිටඩ් සමාගම සමාගම් ආදායම් බද්දෙන් සම්පූර්ණ නිදහස ලබාගැනිම,

(ඈ) ආයෝජන ගිවිසුමේ 17 වන වගන්තියේ දැක්වෙන පරිදි ණය ගිවිසුම යටතේ හොටෙල් ඩෙවලොපර්ස් (ලංකා) ලිමිටඩ් සමාගම විසින් ගෙවිය යුතු පොළී මුදල් හෝ අනිකුත් ගෙවීම් වෙනුවෙන් සියළුම බදුවලින් පූර්ණ නිදහස ලබා ගැනිම,

(ඉ) ආයෝජන ගිවිසුමෙහි 17 වන වගන්තියේ නියම කර ඇති සියළුම ද්‍රව්‍යයන් සහ උපකරණ මත සම්පූර්ණ ආනයන බදු නිදහස ලබාගැනිම.''

100. ඉහත කී ගිවිසුම අනුව 1 වැනි විත්තිකරු ඉහත සඳහන් ජපාන යෙන් මිලියන 340 ක මුදල වෙනත් දේ අතර, ඉහත කී සේවාවන් සඳහාත් වූ ඉහත කී වන්දි මුදල වන ජපන් යෙන් 340,000,000 (මිලියන තුන්සිය හතළිහක්) හොංකොං සෙන්ට්‍රල්, ක්වීන්ස් පාරේ, අංක.16-18 දරණ ස්ථානයේ හොංකොං යූරෝපියන් ඒෂියන් බැංකුවේ අංක.10022558/06 දරණ එස්.සී.එස්.ක්ලොපෙන්බර්ග් මහතාගේ ගිණුමට මුදල් යැවීමට එකඟ වූ බව ඔබ දන්නෙහි ද?

101. ඉහත සඳහන් එම කොන්දේසි නියමයන් සපුරාලීමෙන් අනතුරුව, එකී 1 වැනි විත්තිකරු විසින් ඉහත කී ගිවිසුම යටතේ වූ වන්දි මුදල් වාරික දෙකකින් ටෝකියෝ බැංකුව මාර්ගයෙන් හොංකොං යූරෝපියන් ඒෂියන් බැංකුවේ ඉහත සඳහන් බැංකු ගිණුමට පිළිවෙලින්, 1984 අප්‍රේල් මස සහ 1984 දෙසැම්බර් මස දී මුදල් යවන්නට යෙදුණු බව ඔබ දන්නෙහි ද?

102. ඉහත කී කොන්දේසි නියමයන් හා මෙම නඩුවේ ගොනුකර ඇති 1984.01.31 දින දරණ (පැ.9) ආයෝජන ගිවිසුමෙහි 17 වන වගන්තියේ වෙනත් දේ අතර, ගෙනහැර දක්වා ඇති පරිදි වඩාත් විශේෂයෙන් 17.02 වගන්තියේ නියම කර ඇති කොන්දේසි නියමයන් එකී

ආයෝජන ගිවිසුමට පාර්ශවකරුවෙකු වූ සීමාසහිත කෝර්නල් සහ සමාගම විසින් කටයුතු සැලසීමට ඇති එකම කොන්දේසි නියමයන් බව ඔබ පිළි ගන්නෙහි ද?

103. ඔබ ආයෝජන ගිවිසුම පිටින් වෙනත් දේ අතර 1 වැනි සහ/හෝ 2 වැනි විත්තිකරුවන් ශ්‍රී ලංකාවෙන් පිටත හොංකොං හිදී ගෙවීම් කිරිමට, ඉහත කී කොන්දේසි නියමයන් ඉටුකිරිම සඳහා විධිවිධාන සලසා තිබූ ඉහත සඳහන් කළ එවැනි අතිරේක ගිවිසුම්, අමතර වශයෙන් ඇතිකර ගත්තේ ඇයි? තවද, එවැනි ගෙවීම් කළේ ඇයි? තවද, එවැනි ගෙවීම් කෙරෙනුයේ අවසානයේ දී ඔබේ මුදලින් ම නොවන්නේ ද?

104. වැඩි කොටස් අයිතිකරු සහ ආයෝජන ගිවිසුමට පාර්ශවකරු වන ශ්‍රී ලංකා රජයට එවැනි අතිරේක ගිවිසුම් පිළිබඳව දැනුම් දුන්නේ ද? තවද, එවැනි අතිරේක ගිවිසුම්වලට ඇතුළත්වීම, ඉහත කී කොන්දේසි නියමයන් ඉටුකිරිම සහ ලංකාවෙන් පිටත හොංකොං හිදී ඉහත කී ගෙවීම් කිරිම සඳහා ශ්‍රී ලංකා රජයේ පූර්ව අනුමැතිය ලබාගත්තේ ද? එසේ නැත්නම්, ඒ ඇයි? තවද එවැනි ගෙවීම් කෙරෙනුයේ අවසානයේ දී, ශ්‍රී ලංකා රජය විසින් දෙන ලද එකී රජයේ ඇප සහතික පත්වලින් ආවරණය වූ ඔබේ මුදලින්ම නොවන්නේ ද? නො එසේ නම් ඒ ඇයි?

105. වෙනත් දේ අතර, ශ්‍රී ලංකා රජයෙන් ලබාගන්නා ඇප සහතික ලිපි, ශ්‍රී ලංකාවේ නීතිපතිතුමාගේ මතය, සමාගම් ආදායම් බදුවලින් සම්පූර්ණ නිදහස ලබාගැනිම හා ශ්‍රී ලංකාවේ පොළිය මත බදුවලින් නිදහස ලබාගැනිම, ශ්‍රී ලංකාවේදී ආනයන බදු පිළිබඳ සම්පූර්ණ නිදහස ලබාගැනිම යනාදියට අදාළ ඉහත කී කොන්දේසි නියමයන් ශ්‍රී ලංකා රජයට පමණක් සලසා දියහැකි කොන්දේසි නියමයන් බව ඔබ පිළි නොගන්නේ ද? එසේ නැතිනම්, ඒ ඇයි?

106. එසේ නම්, ශ්‍රී ලංකා රජය විසින් පමණක් ලබාදිය හැකි වරප්‍රසාද/නිදහස් කිරිම් සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත හොංකොං හිදි එවැනි ගෙවීම් කළ හැක්කේ කෙසේ ද සහ කළයුත්තේ ඇයි?

107. ගරු නීතිපතිතුමා විසින් 1984.03.02 දාතමින් යුතුව දෙනු ලැබූ මත ප්‍රකාශය මත ක්‍රියා කරමින් ගරු මුදල් සහ ක්‍රම සම්පාදන ඇමතිතුමා එතුමාගේ 1984 මාර්තු මස 02 දින දරණ ලිපියෙන් කොළඹ හිල්ටන් හෝටල ව්‍යාපෘතිය සඳහා රේගු බදු ගෙවීමේ නිදහසක් නොකළයුතු බවට නිර්දේශ කළ බව ඔබ දන්නෙහි ද? නො එසේ නම්, එකී ගරු ඇමතිතුමා කුමක් කීවේ ද? ගරු නීතිපතිතුමාගේ මතය කුමක් ද?

108. ඉන්පසුව ඉහත කී ගරු නීතිපතිතුමාගේ මත ප්‍රකාශයට ප්‍රතිවිරුද්ධ, 1984.03.06 දිනැති ලිඛිත මතයක්, ඉහත නම සඳහන් 7 වැනි විත්තිකරු විසින් දුන් බව ඔබ පිළි ගන්නෙහි ද? එකී මතය කොළඹ හෝටල් ව්‍යාපෘතියට රේගු බදු ගෙවීම නිදහස් කිරිමට කටයුතු

සැලැස්වූයේ ද? පසුව කොළඹ හිල්ටන් හෝටල ව්‍යාපෘතියට රේගු බදු නිදහස ලබා නොදුන්නේ ද?

109. පැමිණිල්ලෙහි 'ජී' සහ 'එච්' ආයාචනයන්ගෙන් අයැද ඇති ප්‍රකාර අතුරු තහනම් නියෝග නිකුත් කරමින්, වෙනත් දේ අතර, පෙනී යන සැළකිය යුතු තත්ත්වය වනුයේ, මුදල් ගෙවීමක් කළයුතු සමාගමක් සාමාන්‍යයෙන් එවැනි තත්ත්වයක් සම්බන්ධයෙන් ප්‍රශ්න මතු කොට අනිකුත් පාර්ශවකරුවන්ට අත්තනෝමතික ලෙස ක්‍රියා කිරිමට ඉඩ නොහරිනු ලබන බවත්, 1 වැනි සහ/හෝ 2 වැනි විත්තිකරුවන් වෙත ගෙවීම් කිරිමට දැනට කිසිදු පිළිගත හැකි පදනමක් නොමැති බවත් උගත් දිසා විනිසුරුතුමා ඔහුගේ නියෝගයෙහි නිරික්ෂණය කළ බව ඔබ පිළි ගන්නෙහි ද?

110. වෙනත් දේ අතර, ගරු අධිකරණයේ එවැනි නිගමනයන් අභියෝග නොකර එම නිගමනයන් ඔබ විසින් නොපිළිගනු ලැබ ඇද්ද? එසේ නම් ගරු අධිකරණයේ එකී නිගමනයන් මත දැන්වත් කුමන ක්‍රියා මාර්ගයක් ගෙන තිබේ ද? නො එසේ නම්, ඒ ඇයි?

111. පැමිණිලිකරු විසින් ඉහත සඳහන් නඩුව පැවරීමෙන් අනතුරුව, ඔබ අධ්‍යක්ෂ මණ්ඩලයේ රජය විසින් නම්කරනු ලැබූ අධ්‍යක්ෂවරු 6 දෙනෙකුගේ බහුතරයක් ඇති කිරිම සඳහා ඔබගේ අධ්‍යක්ෂ මණ්ඩලය නැවත සංස්ථාපිත කරන්නට යෙදුණු අතර, විමසීමකින් පසුව අතුරු තහනම් නියෝග නිකුත් කිරිමේ දී උගත් දිසා විනිසුරුතුමා විසින් මෙම නඩුවේ කර ඇති ඉහත කී නිරික්ෂණයන් සම්බන්ධයෙන් ඔබ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගෙන ඇති ක්‍රියා මාර්ගය කුමක් ද? එසේ කර නොමැති නම් ඒ මන්ද?

112. ඔබ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරනු ලැබූ පරිදි වරලත් නිර්මාණ ශිල්පී ෂෙල්ටන් විජයරත්න මහතාගෙන් ලබාගත් වාර්තාවේ අඩංගු කරුණු සම්බන්ධයෙන් ඔබ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සලකා බලා ඒ සම්බන්ධයෙන් තීරණයක් ගැනීමේ කතාබහක් සිදුවූයේ ද? එසේ නම්, ඒ මත ගනු ලැබූ ක්‍රියා මාර්ගය කුමක් ද? එසේ නැත්නම් ඒ මන්ද?

113. 1 වැනි සහ/හෝ 2 වැනි විත්තිකරුවන් 3 වැනි විත්තිකරු සමගින් වංක සහයෝගයෙන් ක්‍රියා කරමින්, 1985 ජුලි මසදී 'සංශෝධිත සැලසුම්' වශයෙන් විස්තර කළ අළුත් නිර්මාණ සැලසුම් කට්ටලයක් ඉදිරිපත් කර තිබූ බව ඔබ පිළි ගන්නෙහි ද? නො එසේ නම්, ඒ ඇයි?

114. මෙය කරනු ලැබ ඇත්තේ ඔබ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනු දැනම සහ/හෝ ප්‍රකාශිත අනුමැතිය සහ/හෝ බලය නොමැතිව බව ඔබ පිළි ගන්නෙහි ද? එසේ නම් ඒ සම්බන්ධයෙන් ඔබ ගත් ක්‍රියා මාර්ගය කුමක් ද? එසේ නැත්නම් ඒ මන්ද?

115. පැමිණිලිකරුගේ ඉල්ලීම මත 1 වැනි 2 වැනි විත්තිකරුවන් විසින් කොළඹ හිල්ටන් හෝටලය ඉදිකිරිමේ ප්‍රගතිය සම්බන්ධයෙන්, වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරිමට ඉල්ලමින් 1985 ජූනි සහ ජූලි යන මාසවල පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලදී තීරණය කරනු ලැබූ බව ඔබ පිළි ගන්නෙහි ද? නො එසේ නම්, ඒ මන්ද?

116. ඉහත කී අළුත් නිර්මාණ සැලසුම් කට්ටලයක් ඉදිරිපත් කිරිම, ඉහත කී අධ්‍යක්ෂ මණ්ඩල තීරණය හිතාමතාම කඩකිරිමක් සහ උල්ලංඝනය කිරිමක් වන බව ඔබ පිළි ගන්නෙහි ද? නො එසේ නම් ඒ මන්ද? එසේ වී නම්, ඒ සම්බන්ධයෙන් ඔබ ගත් ක්‍රියා මාර්ගය කුමක් ද? එසේ ක්‍රියා මාර්ගයක් නොගත්තේ නම්, ඒ මන්ද?

117. ''සංශෝධිත සැලසුම්'' ලෙසින් හෝ වෙනත් ආකාරයකින් විස්තර කෙරුණු අළුත් නිර්මාණ සැලසුම් කට්ටලයක් නැවත ඇඳිමට 3 වැනි විත්තිකරුට ඔබගේ අවසරය සහ/හෝ අනුමැතිය නොතිබුණු බව ඔබ පිළි ගන්නෙහි ද? එසේ නම් මේ සම්බන්ධයෙන් ඔබ ගත් ක්‍රියා මාර්ගය කුමක් ද? එසේ නොකළේ නම් ඒ මන්ද?

118. සාමාන්‍යයෙන් නියමිත සහ අවශ්‍ය පරිදි, ඔබ කොළඹ හිල්ටන් හෝටලයේ අයිතිකරු වශයෙන්, එලෙස ''සංශෝධිත සැලසුම්'' ලෙස ඉදිරිපත් කෙරුණු එකී අළුත් නිර්මාණ සැලසුම් කට්ටලයට, ඔබගේ නිළ අත්සන සහ මුද්‍රාව යොදා නැති බව ඔබ පිළි ගන්නෙහි ද? එසේ කර නැතිනම්, ඒ මන්ද? එවැනි නිර්මාණික සැලසුම් මත ඔබගේ නිළ අත්සන සහ මුද්‍රාව ඔබ විසින් තැබිය යුතු නොවන්නේ ද? එසේ නම් ඒ මන්ද?

119. 1985 ජූනි මාසදී ''සංශෝධිත සැලසුම්'' වශයෙන් විස්තර කළ අළුත් නිර්මාණ සැලසුම් කට්ටලයක් ඉදිරිපත් කිරිම නොයෙකුත් ගිවිසුම්/කොන්ත්‍රාත්වල ඒ සම්බන්ධයෙන් වූ නියමයන් කඩකිරිමක් සහ උල්ලංඝනය කිරිමක් බව ඔබ පිළි ගන්නෙහි ද? නොඑසේ නම්, ඒ මන්ද? ඒ සම්බන්ධයෙන් ඔබ ගත් ක්‍රියා මාර්ගය කුමක් ද? එසේ නොමැති නම් ඒ මන්ද?

120. 1985 ජූලි මසදී ''සංශෝධිත සැලසුම'' වශයෙන් විස්තර කළ ඉහත විස්තර කළ අළුත් නිර්මාණ සැලසුම කට්ටලය ඉදිරිපත් කිරිම, සැපයුම් ගිවිසුමට ද වැදගත් ලෙසින් බලපාන බව ඔබ පිළි ගන්නෙහි ද? එසේ නැතිනම් ඒ මන්ද?

121. ''සංශෝධිත සැලසුම්'' වශයෙන් විස්තර කළ අළුත් නිර්මාණ සැලසුම් කට්ටලයක් ඉදිරිපත් කිරිමේ ඉහත කී ක්‍රියාව, එවැනි සංශෝධනයක් රජයත් ඇතුළුව සියලුම පාර්ශවකරුවන් විසින් ලිඛිතව ඇතුළත් වියයුතු බවට ඒ සම්බන්ධයෙන් ඇති ආයෝජන ගිවිසුමෙහි විශේෂයෙන්ම නියම කර ඇති විධිවිධානයන් කඩ කිරිමක් හා උල්ලංඝනය කිරිමක් බව පිළි ගන්නෙහි ද? නොඑසේ නම්, ඒ මන්ද? ඒ සම්බන්ධයෙන් ඔබගත් ක්‍රියා මාර්ගය කුමක් ද? නැතිනම් ඒ මන්ද?

122. ඉහත සඳහන් පරිදි අවශ්‍ය වූ එවැනි ලිඛිත ගිවිසුමකට ඇතුළත් වූයේ නම්, එසේ කරන ලද්දේ කවදා ද? එසේ කර නොමැති නම්, ඒ මන්ද?

123. ආයෝජන ගිණුමේ පාර්ශවකරුවන් වශයෙන් ඉහත සඳහන් රජයේ ඇප සහතික පත් 1 වැනි සහ/හෝ 2 වැනි විත්තිකරුවන් වෙත නිකුත් කරනු ලැබුවේ, වෙනත් පදනම් අතර, ඉහත කී ආයෝජන ගිවිසුමේ පදනම මත බව ඔබ පිළි ගන්නෙහි ද? එසේ නැතිනම් ඒ මන්ද? නො එසේ නම්, කුමන පදනම මත ද?

124. එකී ආයෝජන ගිවිසුමේ පාර්ශවකරුවන් වශයෙන් 1 වැනි සහ 2 වැනි විත්තිකරුවන් ඉහත සඳහන් පරිදි එකී ආයෝජන ගිවිසුම එලෙස කඩකිරීම සහ උල්ලංඝනය කිරීම මගින් ඉහත කී රජයේ ඇප සහතික පත් බල රහිත බවට පමුණුවන බව ඔබ දන්නෙහි ද? එසේ නැතිනම්, ඒ මන්ද?

125. පිළිවෙලින්, 1984 ජනවාරි සහ 1984 මාර්තු මාසවලදී ඔබ අධ්‍යක්ෂ මණ්ඩලය සහ නාගරික සංවර්ධන අධිකාරිය විසින් අනුමත කරනු ලැබුවා වූ මුල් නිර්මාණ සැලසුම්වල සියලුම පිටපත් 1 වැනි සහ/හෝ 2 වැනි විත්තිකරුවන්ගේ ඉදිකිරීම් වැඩබිම් කාර්යාලයේ ඇතිවූ ගින්නෙන් දැවී විනාශ වී යා නොහැකි බව ඔබ පිළි ගන්නෙහි ද? එසේ නැතිනම් ඒ මන්ද?

126. ඔබ කාර්යාලය භාරයේ තිබූ එකී නිර්මාණ සැලසුම්වල අයිතිකාර ඔබේ පිටපත ප්‍රශ්නයට තුඩුදෙන අයුරින් අස්ථානගත වී සහ/හෝ චුවමනාවෙන් ම යටපත් කර ඇති බව ඔබ පිලිගන්නෙහි ද? එසේ නැතිනම්, ඒ මන්ද? එසේ වූයේ නම්, ඒ සම්බන්ධයෙන් ඔබ ගත් ක්‍රියා මාර්ගය කුමක් ද? නැතිනම් ඒ මන්ද?

127. 3 වැනි විත්තිකරුගේ වැඩ නිමකිරීමේ සහ අවසන් සහතික හුදෙක් සාමාන්‍ය ''වෙi සහතික'' ස්වභාවයක ලිපි බව ඔබ පිළි ගන්නෙහි ද? තවද ''සංශෝධිත සැලසුම්'' වශයෙන් පසු කලෙක දී ඉදිරිපත් කරනු ලැබූ නිර්මාණ සැලසුම් කට්ටලයකට එය සම්බන්ධ වූ කරුණු අනාවරණය කිරීමට ඔවුන් අපොහොසත් වී සහ/හෝ චුවමනාවෙන්ම යටපත් කළ බව ඔබ දන්නෙහි ද? එසේ නැතිනම් කුමක් එළිදරව් වූයේ ද? එසේ වූයේ නම් ඒ සම්බන්ධයෙන් ඔබගත් ක්‍රියා මාර්ගය කුමක් ද? එසේ නැතිනම් ඒ මන්ද?

128. 3 වැනි විත්තිකරුගේ එකී සහතික සනාථ කරුණු පිණිස ද්‍රව්‍ය නියම කළ පරිමාණ සහ/හෝ කොළඹ හිල්ටන් හෝටලය ඉදිකිරීමේ හරිවැරදිතා පිරික්සීමට එම බිලපත් සහ අවසාන මිණුම් වාර්තා ඔබ සතුව නොමැති බව ඔබ පිළි ගන්නෙහි ද? එසේ නැතිනම්, නිවැරදිතාවය සම්බන්ධව හරි වැරදි බැලිය හැක්කේ කෙසේ ද? එසේ නම් ඒ සම්බන්ධයෙන් ඔබ ගත් ක්‍රියා මාර්ගය කුමක් ද? නැතිනම් ඒ මන්ද?

129. එම කොළඹ හිල්ටන් හෝටලයට ගෘහ භාණ්ඩ, සවිකරණ දේ සහ උපකරණ සැපයීම පිළිබඳ විෂය ප්‍රමාණය නියම කරනු ලැබූ සැපයුම් කොන්ත්‍රාත්තුවට 'ඒ' වශයෙන් ලකුණු කර තිබූ ප්‍රදර්ශිත ලේඛණය ද ප්‍රශ්නයකට තුඩුදෙන අයුරින් අස්ථානගත වී සහ/හෝ ඔබ කාර්යාලයෙන් වුවමනාවෙන්ම වසන් කොට ඇති බව ඔබ පිළි ගන්නෙහි ද? එසේ නැතිනම් ඒ මන්ද? එසේ නම්, ඒ සම්බන්ධයෙන් ඔබ ගත් ක්‍රියා මාර්ගය කුමක් ද? නැතිනම්, ඒ මන්ද?

130. එම 'ඒ' ප්‍රදර්ශිත ලේඛනය නොමැතිව කොළඹ හිල්ටන් හෝටලයට සැපයූ එවැනි ගෘහ භාණ්ඩ සවිකරණ දේ සහ උපකරණවල වර්ගය නියමයන් සහ ප්‍රමාණයන්වල හරිවැරදි බැලීමට ඔබට නොහැකි බව ඔබ පිළි ගන්නෙහි ද? එසේ නැතිනම් හරි වැරදිතාවය සම්බන්ධව හරි වැරදි බැලිය හැක්කේ කෙසේ ද? එසේ නම් ඒ සම්බන්ධයෙන් කුමන ක්‍රියා මාර්ගයක් ගත්තේ ද? එසේ නැතිනම් ඒ මන්ද?

131. ණය ගිවිසුම යටතේ ඔවුන් විසින්ම සලසනු ලැබූ ණය මුදල්වලින්, 1 වැනි සහ/හෝ 2 වැනි විත්තිකරුවන්, හුදෙක් කාලයාගේ ඈවෑමේ පදනම මත, ගෙවීම් ලබාගෙන ඇති බව ඔබ පිළි ගන්නෙහි ද? එසේ නැතිනම්, එම ගෙවීම ලබාගෙන ඇත්තේ කුමන පදනමක් මතද ?

132. 1 වැනි සහ/හෝ 2 වැනි විත්තිකරුවන්ට එවැනි ගෙවීම් ලබාගැනීම සඳහා, සම්ප්‍රදායිකව නිකුත් කරනු ලබන පරිදි වූ , නිර්මාණ ශිල්පීන් වන 3 වැනි විත්තිකරු විසින් නිකුත් කරන ලද අතුරු වැඩ සහතික නොතිබුණ බව ඔබ පිළි ගන්නෙහි ද? එසේ නැතිනම් එවැනි ගෙවීම් සහතික කිරීමේ සහතික ඇත්තේ කොහේ ද?

133. ඉහත කී නොයෙකුත් වැදගත් ලේඛණ නොමැතිව, එකඟවන ලද වර්ගයන්, මිළ නියමයන්, ප්‍රමාණයන් සහ අගය අනුව එවැනි භාණ්ඩවලින් පරිපූර්ණ වූ කොළඹ හිල්ටන් හෝටලය ඉදිකිරීමේ සහ භාරදීමේ කටයුතුවල හරිවැරදි බැලීමට ඔබට නොහැකි බව ඔබ පිළි ගන්නෙහි ද? එසේ නැතිනම් එවැනි හරි වැරදි සොයා බැලීම කළ හැක්කේ කෙසේ ද?

134. පූර්වෝක්ත සම්බන්ධතාවන් අනුව 1 වැනි සහ/හෝ 2 වැනි විත්තිකරුවන් වෙත ගෙවීම් කිරීම සඳහා ඔබට වලංගු සතුටුදායක සහ පිළිගත හැකි පදනමක් නොමැති බව ඔබ පිළි ගන්නෙහි ද? එසේ නැතිනම් ඒ මන්ද?

135. මෙම නඩුවේ විමසීමකින් පසුව, අතුරු තහනම් නියෝග නිකුත් කරමින් උගත් දිසා විනිසුරුතුමා විසින් දෙනු ලැබූ නියෝගයේ වෙනත් කරුණු අතර, 1 වැනි සහ/හෝ 2 වැනි විත්තිකරුවන් වෙත ගෙවීම් කිරීම සඳහා දැනට පිළිගත හැකි පදනමක් නොමැති බව නිරීක්ෂණය කර තිබූ බව ඔබ පිළි ගන්නෙහි ද?

136. හෝටල අමුත්තන්ගේ කාමර 452 ක් මත කාමර ආදායම් ගණන් බැලීමේ පදනම මත කොළඹ හිල්ටන් හෝටලය වෙනුවෙන් ලාභදායී පූර්වානුමාන ප්‍රකාශ සහ මුදල් ගැලීම් ප්‍රක්ෂේපණ 1 වැනි විත්තිකරු විසින් පිළියෙළ කර ඉදිරිපත් කරනු ලැබූ බව ඔබ පිළි ගන්නෙහි ද? එසේ නැතිනම් ඒ මන්ද?

137. කොළඹ හිල්ටන් හෝටලය මෙහෙයුම් සඳහා විවෘත කිරීමට පෙර සහ පසුව 1 වැනි විත්තිකරු විසින් ස්ථිර ලෙස එකී ලාභදායී පූර්වානුමාන ප්‍රකාශ සහ මුදල් ගැලීම් ප්‍රක්ෂේපණ පිළියෙළ කර ඉදිරිපත් කරන ලද බව ඔබ පිළි ගන්නෙහි ද? නොඑසේ නම් ඒ මන්ද?

138. අමුත්තන්ගේ කාමර සංඛ්‍යාව පිළිබඳව පැමිණිලිකරු විසින් ප්‍රශ්න පැනනැගූ පසු, හෝටල් අමුත්තන්ගේ කාමර 387 පදනම මත කාමර ආදායම ගණන් බලා 1 වැනි විත්තිකරු විසින්ම ප්‍රතිශෝධිත ලාභදායී පූර්වානුමාන ප්‍රකාශය සහ මුදල් ගැලීම් ප්‍රක්ෂේපණයන් පිළියෙල කොට ඔබගේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබූ බව ඔබ පිළි ගන්නෙහි ද? එසේ නැතිනම් ඒ කුමන පදනමක් මත වී ද?

139. ඔබ එකී 1 වැනි සහ/හෝ 2 වැනි විත්තිකරුවන් හා එක්ව ක්‍රියා කර, ණය මුදල් ආපසු ගෙවීමේ හැකියාව පෙන්නුම් කරමින් ඉහත කී පරිදි හෝටල අමුත්තන්ගේ කාමර 452 ක පදනම මත ගණන් බැලුවා වූ එවැනි පූර්වානුමාන ලාභදායී ප්‍රකාශ සහ මුදල් ගැලීම් ප්‍රක්ෂේපනවල පදනම මත, එකී ණය මත ආපසු මුදල් ගෙවීමේ හැකියාව පෙන්වමින්, ශ්‍රී ලංකා රජය සහ/හෝ එහි නිළධාරින් සහ/හෝ නියෝජිතයින් වෙත කරුණු ගෙනහැරපාමින්, ගෘහ භාණ්ඩ සහ සම්පූර්ණයෙන් උපකරණ සපයා ඒවා එම කොළඹ හිල්ටන් හෝටලය ඉදිකර භාරදීම සඳහා එකී 1 වැනි සහ/හෝ 2 වැනි විත්තිකරුවන් විසින් සපයනු ලැබූ ණය මුදල් මත ඉහත කී රජයේ ඇප සහතික පත් ලබාගෙන භාරගැනිමට සම්මුති සාකච්ඡා කොට ක්‍රියා නොකළේ ද? එසේ නැතිනම් ඒ මන් ද?

140. එකී කොළඹ හිල්ටන් හෝටලය වෙනත් දෑ අතර, කාමර 452 කින් ද, (එනම්, කළමනාකරුගේ වාසස්ථානය වශයෙන් කාමර හතර හැර, හෝටලයේ අමුත්තන්ගේ කාමර 452) උසට විහිදෙන මහල් 22 කින් සහ වාහන 400 ක් සඳහා ආවරණය කරනු ලැබූ රථ ගාලකින් ද (එනම් පතුල් මහල්) සමන්විත වන බව ඔබගේ ව්‍යාපාර ප්‍රකාශ මඟින් ශ්‍රී ලංකාවේ ආයෝජනය කරන මහජනතාවට සහ ව්‍යවස්ථාපිත බලධාරින් වෙත ඔබ කරුණු ඉදිරිපත් කර ගෙනහැර නොපෑවෙහි ද? එසේ නැතිනම් ඒ මන්ද?

141. බලපුළුවන්කම ඇති රජයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වන ඉහත සඳහන් 7 වන විත්තිකරු ඔබ අධ්‍යක්ෂ මණ්ඩලයෙහි සාමාජිකයෙකු වශයෙන් සිටිම සහ එහි රැස්වීම්වලට සහභාගී වීම ප්‍රධාන වශයෙන් ජ්‍යෙෂ්ඨ රජයේ සේවකයින් වූ, රජයෙන් නම්කරනු ලැබූ අධ්‍යක්ෂවරුන් හට ඔබගේ සහ ඔබගේ කොටස්කරුවන්ගේ යහපත සඳහා

යෝග්‍ය පරිදි, අවශ්‍ය සහ නිසි පරිදි අවශ්‍ය වන කටයුතු කිරීම සහ යුක්ති ගරුකව ක්‍රියා කිරීම වළක්වාලීමේ බලපෑමකට හේතු නොවන්නේ ද?

1992 මාර්තු මස 06 වැනි දිනදී ය.

පැමිණිලිකරුගේ නීතිඥයින්.